AL/2020/52/S-I(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය / புதிய பாடத்திட்டம் / New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

නර්තනය - (දේශීය) I
நடனம் - (தேசிய) I
Dancing - (Indigenous) I

52 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය : ........................................

පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා

| පිටු අංකය | ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|---|
| 01 | 01 - 03 | |
| 02 | 04 - 13 | |
| 03 | 14 - 21 | |
| 04 | 22 - 35 | |
| 05 | 36 - 43 | |
| 06 | 44 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අති/ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

**උපදෙස්:**

* ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සැපයිය යුතු ය.
* එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100** කි.

● අංක **01** සිට **25** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ **අංකය** ප්‍රශ්නය ඉදිරියෙහි ඇති **වරහන තුළ ලියන්න.**

**1.** පා සරඹ සහ මණ්ඩි පදවල මූලධර්ම හඳුනාගෙන නර්තනය පුහුණු කිරීමෙන්, නිවැරදි
(1) හස්ත චලන ඉදිරිපත් කිරීමේ හැකියාව ලබාගනී.
(2) මූලික අංගහාර සකස් කර ගැනීමේ හැකියාව ලබා ගනී.
(3) ශාස්ත්‍රීය පද නර්තනය කිරීමට හැකියාව ලබාගනී.
(4) තාල තැබීමේ හැකියාව වර්ධනය කර ගනී.
(5) ශරීර නම්‍යතා හැකියාව ලබාගනී. (.........)

**2.** පිළිවෙළින් උඩරට, පහතරට සහ සබරගමු වන්නම් වන්නේ,
(1) මුසලඬි, එක්තාලය සහ නාග ගජගා වේ.
(2) සැවුලා, දෙතාලය සහ කදම්භ පක්ෂි වේ.
(3) ගජගා, නළුගීතිකා තාලය සහ තිසරා වේ.
(4) මයුරා, ලලිතරාග තාලය සහ හනුමා වේ.
(5) කොවුලා, ග්‍රහදණ්ඩ තාලය සහ කිරළා වේ. (.........)

**3.** මංගලම් නර්තනය ඉදිරිපත් කරනු ලබන තිත් රූපය දැක්වෙන වරණය තෝරන්න.
(1) 12 / 12 / 12 / 123 / 1234
(2) 12 / 12 / 123 / 123 / 1234
(3) 12 / 12 / 123 / 1234 / 1234
(4) 12 / 12 / 12 / 123 / 123
(5) 12 / 12 / 12 / 1234 / 1234 (.........)

[දෙවැනි පිටුව බලන්න.

**4.** "**වලියක් මංගල්‍ය විමසුම**" සහ "**සබරගමු නර්තන කලාව**' යන කෘති රචනා කරන ලද්දේ පිළිවෙළින්,
(1) මුදියන්සේ දිසානායක සහ ජයසේන කෝට්ටගොඩ ය.
(2) මුදියන්සේ දිසානායක සහ තිස්ස කාරියවසම් ය.
(3) මුදියන්සේ දිසානායක සහ ශ්‍රියානි රාජපක්ෂ ය.
(4) ජේ.ඊ. සේදරමන් සහ ශ්‍රියානි රාජපක්ෂ ය.
(5) ශ්‍රියානි රාජපක්ෂ සහ ලයනල් බෙන්තරගේ ය. (.........)

**5.** "තහලම් කළබෙර තම්මැට පට තන්තිරි ඩමරු..." යන කවිය සඳහන් වන්නේ, ගම්පොළ යුගයේ රචිත
(1) මයුර සංදේශයේ ය.
(2) තිසර සංදේශයේ ය.
(3) පරවි සංදේශයේ ය.
(4) සැළලිහිණි සංදේශයේ ය.
(5) ගුත්තිල කාව්‍යයේ ය. (.........)

**6.** "ගුම් දැහිං ගුඳ ගුඳ දැහිං - රිංගත ගදිගත ගුඳිතක දිකුඳකු දොම්" යන පදයෙන් සභාවට පිවිසෙන චරිතය වන්නේ,
(1) ජසයා ය.
(2) නොන්චි ය.
(3) ලෙන්චිනා ය.
(4) අණබෙරකරු ය.
(5) මුදලි ය. (.........)

**7.** කළුකුමාර බලිය සහ කපුයන්ත්‍රය යන සැරසිලි අන්තර්ගත ශාන්තිකර්මය කුමක් ද?
(1) දෙවොල්මඩුව
(2) පහන්මඩුව
(3) සූනියම
(4) රටයකුම
(5) වලියකුම (.........)

**8.** මුල්මාත්‍රයට අදාළ මූලික බෙරපදය අයත් වරණය තෝරන්න.
(1) කුං දිත් තත් රෙගත ගදිත ගත.
(2) ගත් දිත් තත් දොමිත ගදිත ගත.
(3) දොං තකු දොං ජිංතක තරිකිට.
(4) කුං දිත් තත් දොං තක තරිකිට.
(5) ජිංත ජිමිත්තක් තක්කිට තරිකිට. (.........)

**9.** බලි ඇදුරාගේ රංග වස්ත්‍රාභරණවලට අයත් කොටස් වන්නේ,
(1) ජටාව, අවුල්හැරය සහ බන්දි වළලු ය.
(2) ජටාව, උරබාහු සහ අවුල්හැරය ය.
(3) සේලය, ජටාව සහ අවුල්හැරය ය.
(4) උරමාලය, නවගුණවැල සහ ඉනහැඩය ය.
(5) උරමාලය, නවගුණවැල සහ පච්චවඩම ය. (.........)

**10.** "ඉනේ හවඩි රන් කෙඳිවන් පයේ ගිගිරි වළලු ලවන්" යන කවිය අයත් වන්නේ,
(1) මඩුපුරයට ය.
(2) නානුමුරයට ය.
(3) කොහොඹාහැල්ලට ය.
(4) ග්‍රහපන්තිවලට ය.
(5) සිරසපාදවලට ය. (.........)

**11.** මාත්‍රා $2 + 3$ තාලරූපයට සමාන කර්ණාටක තාලය වන්නේ,
(1) ඛණ්ඩ චාපු තාලය යි.
(2) තිශ්‍ර චාපු තාලය යි.
(3) මිශ්‍ර චාපු තාලය යි.
(4) රූපක තාලය යි.
(5) ආදි තාලය යි. (.........)

**12.** වෙනිවර, ගැටිය හා සවරම යොදාගනු ලබන්නේ පිළිවෙළින්,
(1) ගැටබෙරය, පහතරට බෙරය හා උඩැක්කියට ය.
(2) ගැටබෙරය, දවුල හා උඩැක්කියට ය.
(3) පහතරට බෙරය, උඩැක්කිය හා දවුලට ය.
(4) පහතරට බෙරය, තම්මැට්ටම හා දවුලට ය.
(5) තම්මැට්ටම, ගැටබෙරය හා උඩැක්කියට ය. (.........)


**13.** අනුරාධපුර යුගයේ නර්තන කලාව පිළිබඳ සාධක දැක්වෙන මූලාශ්‍රය ලෙස සැලකෙන්නේ,
(1) මහාවංශය සහ උම්මග්ග ජාතකය යි.
(2) චූලවංශය සහ දඹදෙණි අස්න යි.
(3) චූලවංශය සහ කඳවුරු සිරිත යි.
(4) මහාවංශය සහ චූලවංශය යි.
(5) කඳවුරු සිරිත සහ මහාවංශය යි. (.........)


**14.** උඩරට, පහතරට හා සබරගමු සම්ප්‍රදායයන්ට අයත් ශාන්තිකර්ම නාට්‍යමය පෙළපාලි පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) විජේරාජ කතාව, අඹ විදමන සහ පොත්කඩේ යක්කම
(2) ඌරා යක්කම, දෙවොල් ගොඩබෑසීම සහ මුවමල විදීම
(3) ඌරා යක්කම, නානුමුරය සහ පොත්කඩේ යක්කම
(4) නයා යක්කම, අඹ විදමන සහ වැදි යක්කම
(5) මහා යක්කම, බොරු යක්කම සහ ගබඩා කොල්ලය (.........)

**15.** රංග වින්‍යාසය හා සබැඳි මූලික සංකල්ප ලෙස සැලකෙන්නේ,
(1) චලනය, ශරීරය සහ අංගහාර වේ. (2) චලනය, අවකාශය සහ සම්බන්ධතා වේ.
(3) ශරීරය, හැඩතල සහ නිර්මාණ වේ. (4) ශරීරය, තාලය සහ හැඩතල වේ.
(5) අංග, ප්‍රත්‍යාංග සහ උපාංග වේ. (.........)

**16.** රජයේ ලලිත කලායතනය ආරම්භ කරන ලද වර්ෂය කුමක් ද?
(1) 1936 (2) 1945
(3) 1952 (4) 1972
(5) 1974 (.........)

**17.** පහත **A** සහ **B** නළඟන රූප දැකගතහැකි වන්නේ,


**A**


**B**

(1) ගඩලාදෙණිය විහාරයේ හා ඇම්බැක්කේ දේවාලයේ ය.
(2) බෙන්තොට ගලපාත විහාරයේ හා ඇම්බැක්කේ දේවාලයේ ය.
(3) ඇම්බැක්කේ දේවාලයේ හා යාපහුව මාළිගාවේ ය.
(4) බෙන්තොට ගලපාත විහාරයේ හා යාපහුව මාළිගාවේ ය.
(5) ගඩලාදෙණිය විහාරයේ හා යාපහුව මාළිගාවේ ය. (.........)

**18.** ශාන්තිකර්ම සැරසිලි ආශ්‍රිත කැටයම් නිර්මාණය කිරීම සඳහා භාවිත අමුද්‍රව්‍ය ලෙස සැලකෙන්නේ,
(1) රඹ පතුරු, ගොක්කොළ සහ නියඳ කෙඳි ය.
(2) ගොක්කොළ, බුරුල්ල අතු සහ රඹ පතුරු ය.
(3) ගොක්කොළ, පුවක් අතු සහ නියඳ කෙඳි ය.
(4) තොලඹෝ, හබරල සහ ගොක්කොළ ය.
(5) රඹ පතුරු, ගොක්කොළ සහ හබරල කොළ ය. (.........)

**19.** "ගත්තම් ගත් දිත ගදිතකු දොම් දොම් ත කු දොම් ......" මෙම පද කොටස අයත් නර්තනාංගය වන්නේ,
(1) ගිරිදේවි නර්තනය යි. (2) ශුද්ධමාත්‍රය යි.
(3) මංගලම් නර්තනය යි. (4) මුල්මාත්‍රය යි.
(5) දෙවොල් නර්තනය යි. (.........)

**20.** සළු පාලිය සහ මරු සන්නියේ දී උද්දීපනය වන රස වන්නේ,
(1) හාස්‍ය සහ වීර රසය යි. (2) බීභත්ස්‍ය සහ භයංකාර රසය යි.
(3) ශෘංගාර සහ රෞද්‍ර රසය යි. (4) හාස්‍ය සහ භයානක රසය යි.
(5) ශාන්ත සහ වීර රසය යි. (.........)

**21.** ශාන්තිකර්මවල දී වෙස් මුහුණු වෙනුවට අංග රචනා ක්‍රමවේද භාවිත කෙරෙන චරිත ලෙස සැලකෙන්නේ,
(1) රීරියකා සහ ලිච්ඡවි ය. (2) රීරියකා සහ වඩිගපටුන ය.
(3) වඩිගපටුන සහ කෝල සන්නිය යි. (4) ලිච්ඡවි සහ ගොළු සන්නිය යි.
(5) වඩිගපටුන සහ මරු සන්නිය යි. (.........)

**22.** වලියක් මංගල්‍යය ශාන්තිකර්මය පවත්වනු ලබන්නේ,

(1) මහනුවර ශ්‍රී විෂ්ණු දේවාලයේ දී ය.
(2) මහනුවර පත්තිනි දේවාලයේ දී ය.
(3) මහනුවර දළදා මාළිගාවේ දී ය.
(4) අළුත්නුවර ශ්‍රී විෂ්ණු දේවාලයේ දී ය.
(5) අළුත්නුවර පත්තිනි දේවාලයේ දී ය. (.........)

**23.** "කළුවන් කළුරුවයි මංගෝ දිලිසෙනවා" මෙය,

(1) පැල් කවියකි.
(2) නෙළුම් කවියකි.
(3) පතල් කවියකි.
(4) කරත්ත කවියකි.
(5) හටන් කවියකි. (.........)

**24.** 'චක්කියාර් කුත්තු' රඟ දක්වන ලද නර්තන සම්ප්‍රදාය කුමක් ද?

(1) භරත නාට්‍යම් ය.
(2) කථකලි ය.
(3) කථක් ය.
(4) ඔඩිසි ය.
(5) මෝහිණී ආට්ටම් ය. (.........)

**25.** පහත රූපයෙන් දැක්වෙන අවස්ථාව අයත් මුද්‍රානාට්‍ය වන්නේ,



(1) නිදි කුමරිය ය.
(2) කරදිය ය.
(3) බැරිසිල් ය.
(4) පටාචාරා ය.
(5) කුඹී කතාව ය. (.........)

● අංක **26** සිට **35** තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර යොදා **හිස්තැන් පුරවන්න.**

**26.** ඇදෙන අකුරක් සමග හල් අකුරක් එකතුවීමෙන් .................................. මාත්‍රයක් නිර්මාණය වේ.

**27.** ශබ්දම්, පදම් හා තිල්ලානා යන නර්තන අංග .................................. නර්තන සම්ප්‍රදායයට අයත් වේ.

**28.**

| x | 2 | 0 | 3 |
|---|---|---|---|
| ධා ධිං s | ධා ධා ධිං s | ත තිං s | ධා ධා ධිං s |

යන හින්දුස්ථානි දීප්චන්දි තාලය, දේශීය තිත් තාල ක්‍රමයට අනුව ......................... දෙතිතට සමාන වේ.

**29.** "ග ත ගුම් රිංගත ගදිගත ගදිත ගතම්" යන බෙරපදයට අනුව ................................ කෝලම සභාවට පිවිසෙයි.

**30.** ඉතාලියේ ප්‍රභවය වූ බැලේ රංග කලාව, XIV වන ලුවී රජුගේ අනුග්‍රහයෙන් ................................ දී වඩාත් සංවර්ධිත තත්ත්වයකට පත් විය.

**31.** කීල බැඳීම, කාලි යාම හා ගරා නැටීම යන චාරිත්‍ර ඉටු කරනු ලබන්නේ උඩරට ................................ ශාන්තිකර්මයේ දී ය.

**32.** පතහවිස්ස, මාලක්කම, බඹර වළල්ල යනු ................................ නර්තන සම්ප්‍රදායේ භාවිත පැනීම්, කැරකීම් විධි කිහිපයකි.

**33.** තම්මැට්ටමේ ගැටිවැල සහ ................................ සඳහා කිරිඳි වැල් භාවිත කිරීම වඩාත් යෝග්‍ය වේ.

**34.** බැරිසිල් මුද්‍රානාට්‍යයෙහි රංග වින්‍යාසය සැලසුම් කර ඇත්තේ ................................ විසිනි.

**35.** එදිරිවීර සරත්චන්ද්‍රයන්ගේ නිර්මාණයක් වූ සිංහබාහු ................................ නාට්‍යයකි.

[පස්වැනි පිටුව බලන්න.

● අංක **36** සිට **50** තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුරු **තිත් ඉර** මත ලියන්න.

**36.** "අක්කා ඉතින් නාඩන්නේ" මෙහි අන්තර්ගත ලඝු සහ ගුරු මාත්‍රා ගණන දක්වන්න.

(i) ලඝු මාත්‍රා : ........................................................................

(ii) ගුරු මාත්‍රා : ........................................................................

**37.** රුක්මණී දේවි අරුන්ඩෙල් හා අච්චන් මහරාජ් යන අය පුරෝගාමී වූ නර්තන සම්ප්‍රදායයන් නම් කරන්න.

(i) රුක්මණී දේවි අරුන්ඩෙල් : ........................................................

(ii) අච්චන් මහරාජ් : ..................................................................

**38.** බුදුසිරු කුමරු පිළිබඳ කතා පුවත සම්බන්ධ ශාන්තිකර්මය හා එය අයත් නර්තන සම්ප්‍රදායය නම් කරන්න.

(i) ශාන්තිකර්මය : ....................................................................

(ii) සම්ප්‍රදායය : ........................................................................

**39.** බටහිර බැලේ රංගන ශිල්පිනියන් භාවිත කරන රැලි සහිත කෙටි ගවුම හා දිග ගවුම හඳුන්වන නාමයන් සඳහන් කරන්න.

(i) කෙටි ගවුම : ......................................................................

(ii) දිග ගවුම : ........................................................................

**40.** පොළොන්නරු යුගයේ සරස්වතී මණ්ඩපය සහ සැටදාගෙය ඉදිකරන ලද රජවරුන් නම් කරන්න.

(i) සරස්වතී මණ්ඩපය : ..............................................................

(ii) සැටදාගෙය : ......................................................................

**41.** පහත **A** හා **B** රූපවල දැක්වෙන වෙස් මුහුණු භාවිත වන්නේ කිනම් චරිත නිරූපණය කිරීම සඳහා ද?



**A**



**B**

(i) **A** රූපය : ........................................................................

(ii) **B** රූපය : ........................................................................

**42.** බලි ශාන්තිකර්මයේ දී බලි ඇදුරා භාවිත කරන ප්‍රධාන රංගභාණ්ඩ **දෙක** නම් කරන්න.

(i) ........................................................................................

(ii) ........................................................................................

**43.** අතිශයෝක්ති වර්ණනා සහිතව මහනුවර යුගයේ දී නිර්මාණය වූ ගායන විශේෂය හා එය ප්‍රාසංගිකව ඉදිරිපත් කළ ස්ථානය නම් කරන්න.

(i) ගායන විශේෂය : ..................................................................

(ii) ස්ථානය : ..........................................................................

**44.** පහත දැක්වෙන නර්තන අංග අයත් ශාන්තිකර්ම වෙන් කොට දක්වන්න.

(i) ආඩිගුරු නැටීම : ..............................................................

(ii) ලිච්ඡවි නර්තනය : ..............................................................

**45.** "රනේ රන් වළලු අතලා ගෙනේ යා – කනේ එරන් පුස්කොළ ලා ගෙනේයා"
යන කවිය අයත් ශාන්තිකර්මය හා පෙළපාළි අංගය නම් කරන්න.

(i) ශාන්තිකර්මය : ..............................................................

(ii) පෙළපාළි අංගය : ..............................................................

**46.** **ථුම්රි** සහ **තෝඩායම්** නර්තන අංග අයත් සම්ප්‍රදායයන් නම් කරන්න.

(i) ථුම්රි : ..............................................................

(ii) තෝඩායම් : ..............................................................

**47.** ප්‍රස්තාරකරණයේ දී තිත් හා තෙයි (∧, /) යන තාල සංකේත සඳහා භාවිත වන පාරිභාෂික වචන ලියන්න.

(i) ∧ : ..............................................................

(ii) / : ..............................................................

- අංක **48** සිට **49** තෙක් ප්‍රශ්නවලට පහත දැක්වෙන රූප ඇසුරින් පිළිතුරු සපයන්න.



A B C D

**48.** ඉහත **A** සහ **B** රූපවලින් දක්වා ඇති නළලට පලඳින රංගාභරණ නම් කරන්න.

(i) **A** : ..............................................................

(ii) **B** : ..............................................................

**49.** ඉහත **C** සහ **D** රූපවලින් දක්වා ඇති නළලට පලඳින රංගාභරණ භාවිත වන සම්ප්‍රදායයන් නම් කරන්න.

(i) **C** : ..............................................................

(ii) **D** : ..............................................................

**50.** අංග රචනයේ දී මිනිස් මුහුණක මූලික ආකෘති වෙන්කර ගනු ලැබේ. ඒ අතුරින් පහත දැක්වෙන හැඩතල හඳුන්වන පාරිභාෂික නාමයන් ලියා දක්වන්න.

(i) ◯ : ..............................................................

(ii) △ : ..............................................................

***